# දිල්ලියේ බමුණු උවමනාවට හදපු බැංකි මූන් වාර්තාව

ලෝක බලවතුන් බැංකි මූන් හරහා දැන් මහින්දට බරපතල චෝදනා ඉදිරිපත් කරල තියෙනවා. මහින්ද ගෙන ගියේ ජන ඝාතක යුද්දයක් කියන එක අපි දිගටම කිව්වා. මේ දරුණු වැඩපිළිවෙල ගෙන ගියේ යැංකි, මංකි හමුදාවල අනුග්‍රහයෙන්.

ඒ ඇමරිකා, ඊශ්‍රායෙල්, ඉන්දියන් හමුදා නාඩාර්ලා තමා ඔක්කොම ගුරුහරුකම් ලංකාවේ හමුදාවට උගන්වලා පෙන්වලා දුන්නේ. රට උස්සන හැටි, දවල්ට කඩා පනින හැටි, හැම මළ එකාම ත්‍රස්තවාදියෙක් කරන හැටි, මේ ආදී කී නොකී සෑම සටන් ක්‍රමයක්ම කියල දුන්නේ මේ මහ බලවතුන්ම තමයි. උදාහරණ ගත්තේ ඉරාකයෙන්, පලස්තීනයෙන්, නැත්නම් ඇෆ්ගනිස්තාන්වල සටන්වලින් තමයි.

ඒ විතරක් නෙවෙයි මේ අයට උවමනා හැම විදියකම ආයුද ලබා දුන්නෙත් මේ බලවතුන්ම තමයි. එතකොට මහින්දලා කරපු අපරාධවලට වඩා සිය ගුණයටකට වැඩි අපරාධ කරපු උදවිය තමයි දැන් මේ බණ කියන්න එන්නේ.

අපි මේ දේ මුල ඉඳලම කිව්වා මේ රටේ පාලකයින්ට. ගෝලීය බලවතුන් ගහන පදේට නටල අන්තිමට විනාශයක් කරගෙන උන්ගෙම නඩු විභාගයක විත්තිකරුවන් වන බව මොනවට පැහැදිලි කළා.

අපේ මේ තරුණයන් කැරලි ගහන විට පරදේශවල මිලිටරි බලවතුන් සමඟ එකතුවෙලා උන්ව මරා දාල ප්‍රශ්න විසඳන්න බැරි බව අපි මුල ඉඳලම කියල දුන්නා. ඒ වෙලාවේ මුන්ගේ හෙංචයියෝ අපට කොටි බාප්පලා කියල බොරු චෝදනා නගමින් කරුවලේ ගමන ඇදගෙන ගියා.

දැන් ඒ මහ බලවතුන්ම ඇහට කඩා පනින කොට කට ඇරගන්න බැරිව ඒ කයිවාරුකාරයෝ බලා ඉන්නවා. ඊශ්‍රායෙල්වල කරපු අපරාධවලට කිසිම වගවිභාගයක් කරන්න බැරි UN ලේකම්වරු මෙතැන ඇවිත් අපරාධ වට්ටෝරුව දිග අරිනවා.

ඔව්වා අපි  කියල, කෑ ගහල හුඟක් කල්. දැන් මේ අයත් ඒ ගැන කථා කිරීමෙන් අපි කියපුව කොච්චර ඇත්තද කියල බලා ඉන්න අයට පෙනේවි. එතැනින් එහා මේ ඇත්තෝ මොනවද කරන්න යන්නේ?

කරන්නට යන එකම දේ මහින්දගේ කර පටිය තද කරගෙන මේ රට තුළ උන්ගේ ග්‍රහනය වැඩි කරගන්නට වැඩ කරාවි. දේපොල, සම්පත් මංකොල්ලය වඩා හොඳින් කරන්න පුළුවන් විදියට සැලසුම් හදා ගන්න කටයතු කරාවි.

දැනටමත් අපි වහල් රටක් බවට පත්වෙලා ඉවරයි. උන්ගේ ණයකරයන්ට අපි හොඳටම යට වෙලා ඉවරයි. දැන් කරගෙන යන සංවර්ධනය තනිකරම මේ ණය මත පදනම්වෙලා කරන්නේ. ඒ නිසා අපි ජාතිජාතිත් ණය වෙලා ඉන්නේ. ඒ අස්සේ මේ මානව හිමිකම් කඩකිරීමේ චෝදනා ගෙන එන්නේ අපට මොකුත් නෑ බෑ කියන්න බැරි විදියටයි.

මිතුරන් වගේ ගොඩබැහැලා බෙල්ලම කපන එක එදා අධිරාජ්‍යවාදීන් ගෙන ගිය ප්‍රතිපත්තිය. අදත් ඒකම තමා වෙන්නේ. වෙනසකට තියෙන්නේ ආයුධ කෙළින් පෙන්නන්නේ නැතිව ගිවිසුම් තුළින් හැම දෙයක්ම සිදු වෙන එක විතරයි. මහින්ද ඒ ගිවිසුම් අතර හොඳටම අහු වෙලා වගෙයි. එයා අහු වුණ එක නෙවෙයි ප්‍රශ්නය. මේ මුළු රටේම නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය යට වෙලා යාම හැම කෙනෙකුටම ප්‍රශ්නයක්.

බැන්කී මූන් තමන්ගේ ලියැවිල්ල තුළ සුදු කොඩි කතාවක් දමල නෑ. ඒත් තමන් ගාව බලවත් සාක්කි තියෙනවා කියල පෙන්වල තියෙනවා. අවශ්‍ය නම් ඉදිරියට ගන්නව කියල තමයි ඒ ගැන අවධාරණය කරල තියෙන්නේ.

කොටි සංවිධානය කරපු යුද අපරාධ ගැනත් කතා කරල තියෙනවා. අසම්මත, නීති විරෝධී ගරිල්ලා සංවිධනයක් නීති කැඩීම ගැන කථා කිරීම නිකම්ම ඔපාදූප කතාවක්. කොටි සංවිධානයේ ක්‍රියාකාරිත්වය ගැන වගකියන කිසි කෙනෙක් නෑ. එහෙම ඉතිරි කරලත් නෑ.

එහෙම නම් ඒවා මේ ලියැවිල්ලට ඇතුල් කිරීම නිකම් සෝබන වැඩක් විතරයි. ඇත්තටම තියෙන්නේ ආණ්ඩුව කරපු අපරාධ ප්‍රශ්නය. දැන් මේවා ගැන තීන්දු ගන්න යන්නේ ලොකු අපරාධවලට අතගහපු ගෝලීය බලවතුන්මද?

බැන්කී මූන් මේ ලියැවිල්ල තුළින් බලාපොරොත්තු වෙන්නේ යුද උසාවියකට මහින්දව ගෙනියන්න කියල කවුරු හරි හිතනවා නම් ඒක ලොකු මෝඩකමක්. දැන් දෙමළ පිටරට උදවිය දහලන්නේ ඒ වගේ උසාවියක් ඇති කරවා ගන්න.

ඒත් ලෝක බලවතුන්ට තමන් හදාවඩාගත්ත, තමන්ගේ ආර්ථික වැඩපිළිවෙල හොඳට ඉදිරියට ගෙන යන, නායකයව හිරේ දමන්න ඕනෑ කියල කවුරුත්වත් හිතනවද? ගිය සතියේ මහින්දගේ ආර්ථික වැඩපිළිවෙල ගැන ලොකු සහතික මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කළා.

එතැනදී කියැවුනේ මහින්දගේ රාජ්‍ය ස්ථාවරත්වය, ආරක්ෂාව මේ ආර්ථික වැඩපිළිවෙලට ලොකු පිටිවහලක් වුණ බවක්. එහෙම නම් එවැනි රජයක් අස්ථාවර කරන්න උන්ම පියවර ගනීවි කියල හිතන එක එතරම් නුවණක්කාර නෑ.

ඒ නිසා ඒ ගැන විමසා බැලුවහම පෙනෙනවා දැන් මේ යන්නේ වෙන ගේමක්. මහින්දව යට කරල තමන්ට ගැලපෙන ආර්ථික සැලසුම් මේ රට තුළ ඇති කරගැනීමටයි මාන බලන්නේ.

ආර්ථික වැඩපිළිවෙල ඉදිරියට ගෙන ගියාට තවම දෙමළ ධනපතියන්ගේ විශ්වාසය ඇති කරගැනීමට මහින්දට පුළුවන් වෙලා නෑ. ඒ නිසා එය වැදගත් කටයුත්තක්. ඉන්දීය බලපෑමත් ඇති ලොකුම ප්‍රශ්නයක් තමා දෙමළ නායකයින්ට බලයක් රට තුළ නැති එක. ඒ නිසා ඔවුන් වෙනුවෙන් ලොකු වැඩසටහනක් දියත් කරල තියෙනවා. ඒකයි ඇත්ත.

බැන්කී මූන්ගේ පරල වීමේ ඇත්ත ප්‍රශ්නය තියෙන්නේ වෙන කොහේවත් නෙවෙයි දිල්ලිවලමයි. දිල්ලිවල රජ කරන බමුණු කණ්ඩායම තමන්ට උවමනා විදියට ලංකාවේ පාලනය මෙහෙයවා ගැනීම වෙනුවෙන් වැඩ කරගෙන යනවා. ඒ වෙනුවෙන් තමා මේ බැංකි මූන්ගේ වැඩකොටසත් සිදුවෙන්නේ.

මහින්ද රාජපක්ෂ අද වෙනකොට මේ බලවේගෙට අහුවුණ කෙනෙක් බවට පත් වෙලා. මේ අනුව රට පාවා දීම සිදු වෙලා තියෙන්නේ මෙන්න මේ යටවීම තුළින්. ඉංදියාවට උවමනා යුද්දය දියත් කරල ඒ අනුව විනාශයට කර ගහල දැන් උන්ගේ ගොදුර බවට අපි පත්වෙලා.

දෙමළ අය හිතනව මේ වාර්තාව නිසා දෙමළ ස්වපාලනය නැත්නම් ඊළාම් රාජ්‍යයක් හදන්න පුළුවන් කියලා. මේ මගින් දෙමළ නිදහස ලබා ගැනීම කොහොම වෙතත් දෙමළ ධනපතියන් රජයට ඇතුල් කරගැනීමක් සිදු වෙන්න පුළුවන්. ඒත් ඒකටත් විශාල ගැටුම් ඇති වෙන්න පුළුවන්.

විශේෂයෙන්ම දැන් ජාතිවාදීන්ගේ මතය වෙලා තියෙන්නේ බටහිරට යට නොවී රුසියාව, චීනය සමඟ එකතුවෙලා අලුත් එක්සත් ජාතීන්ගේ සංගමයක් හදන්න ඕනෑ කියලයි. ගෝලීය ධනවාදය ක්‍රියාත්මක වන අකාරය ගැන අබමල් රේණුවක් නොදන්නා ළාමක අදහසක් ඒක.

අද ලෝක බහුජාතික සමාගම් වළලල්ට යට වෙලා වැඩ කරන මේ ආණ්ඩුවට එයින් ඉවත් වෙන්න නම් ලෝක පරිමාණව වැඩ කරන ජනතාවගේ සහයෝගය ගන්න වේවි. රුසියාව, හා චීනය ඉන්දියාව සමඟ ඉතා සමීපව BRIC එකමුතුව තුළ වැඩ කරමින් ඉන්නේ.

එවන් තත්ත්වයක් තුළ චීනය, රුසියාව ඉන්දියාවට විරුද්ධ සටනකට එක්සත් ජාතීන්ගේ සංගමය කඩාගෙන ඒවි කියලා කල්පනා කිරීම මන්ද බුද්ධික අදහසක්. ඇමරිකන් බලවතුන් එදා මහින්දගේ යුද්ධයට උදවු වුනේ ශක්තිමත් රාජ්‍ය බලයක් ගොඩනැගීමේ කල්පනාව අරගෙනයි.

අනෙක් අතට ඔවුන් දකුණේ තරුණ කැරැල්ල වාගේම උතුරේ කැරැල්ලත් බහුජාතික සමාගම් තන්ත්‍රයට විරුද්ධව ඇති වුණ දෙයක් ලෙසට නිවැරදිව කල්පනා කළා. මහින්ද රාජපක්ෂ එය සිංහලයන් නැසීමට ආ "ජාත්‍යන්තර" ත්‍රස්තවාදයක් බවට පත් කළා.

ඒ අනුව විරුද්ධ මත ඇතිව වුණත් සිංහල ජාතිවාදී බලයක් ගොඩනැගීමට ක්‍රියා කිරීමෙන් මේ විදියට ඔවුන්ගේ වහල්භාවයට මේ රාජ්‍යය පත් වෙලා තියෙන්නේ. මෙයින් ගැලවෙන්ට නම් මහින්දට ඇත්තට මුහුණ දෙන්න වෙනවා.